[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය I | පැය - 01 යි. |
|---|---|---|---|

නම ..............................

### I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01). ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වීමට හේතුවක් වන්නේ මින් කුමක්ද?

1). නීති සම්පාදනය කරනු ලබන්නේ ජනාධිපතිගේ අභිමතය මත වීම.
2). සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම.
3). නියෝජිතයින් තෝරා ගන්නේ මහ ජනතාවගේ බහුතර කැමැත්ත මත වීම.
4). සමානාත්මතාවට ගරු කිරීම දක්නට ලැබීම.

02). පහත සඳහන් ප්‍රකාශ අතරින් නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ අඩංගු පිළිතුර තෝරන්න.

1). වසරේ ඕනෑම කාලයක මැතිවරණ පැවැත්වීම.
2). සෑම පුරවැසියෙකුටම ඡන්ද දායකත්වය ලැබීමේ අයිතිය.
3). නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
4). මැතිවරණ පැවැත්වීමට සමාජ පරිසරය වැදගත් නොවීම.

03). මිනිසෙකු ලෙස ගරුත්වයකින් යුතුව සමාජයේ ජීවත් වීම සඳහා ඔහුට උපතින්ම ලැබෙන කිසිදු විශේෂයකට ලක් නොකළ යුතු හිමිකම්,

1). යුතුකම් ය.
2). අයිතිවාසිකම් ය.
3). මානව අයිතිවාසිකම් ය
4). සමානාත්මතාවය ය

04). ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරනු ලබන්නේ?

1). පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් මඟිනි.
2). රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟිනි.
3). මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව මඟිනි.
4). මැතිවරණ කොමිෂන් සභාව මඟිනි.

05). ද්වි පක්ෂ ක්‍රමයක් ඇති රටවල් දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1). බ්‍රිතාන්‍ය,ඉන්දියාව
2). බ්‍රිතාන්‍ය,ඇමරිකා එක්සත් ජනපදය
3). කියුබාව,ඇමරිකා එක්සත් ජනපදය
4). ශ්‍රී ලංකාව,ඉන්දියාව



EXAMRESULTS.LK

06).සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී ගැටලුවක් වන්නේ,

1).රාජ්‍යයක ආදායම් බෙදීයාමේ විෂමතාවක් පැවතීමය.

2).රාජ්‍යයක විවිධ පක්ෂ පැවතීමය.

3).සමාජ අවශ්‍යතා සරල වීමය.

4).රාජ්‍යයක ජනගහනය අධික වීම ය.

07). ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,

1).සර්වජන ඡන්ද බලය යනුවෙනි.

2).පරමාධිපත්‍ය බලය යනුවෙනි.

3).ඒකාධිපති බලය යනුවෙනි.

4).නීතියේ ආධිපත්‍ය බලය යනුවෙනි.

08).තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වන පාලන ක්‍රම සහිත රාජ්‍ය හැඳින්වෙනුයේ කුමන නමකින්ද?

1).ඒකීය රාජ්‍යය.

2).ජාතික රාජ්‍යය.

3).සන්ධීය රාජ්‍යය.

4).රාජාණ්ඩුව

**අංක 9 හා 10 ප්‍රශ්න සඳහා පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

A. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තෝරී පත්වේ.

B. විධායක බලය හසුරුවන්නේ ජනාධිපතිවරයාය.

C. විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නැත.

D. විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබේ.

09).ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විශේෂ ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1).AB 2).BC 3).CA 4).AD

10).පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක විශේෂ ලක්ෂණ දැක්වෙන පිළිතුර තෝරන්න.

1).AC 2).BD 3).AD 4).CA

11).මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් හඳුන්වන නම කුමක්ද?

1).අවශ්‍යතා 2).වුවමනා

3).නිෂ්පාදනය 4).භාණ්ඩ හා සේවා

12).බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු සතු ගුණාංගයක් වන්නේ?

1).අන්‍ය මත වලට ගරු නොකිරීම ය.

2).අන්‍ය ආගම් වැළඳ ගැනීම ය.

3).සාමූහිකත්වය වර්ධනය කිරීමය.

4).අන්තර් විවාහ සිදු කිරීමය.

13).ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදාගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම,

1).නිෂ්පාදනය යි 2).බෙදාහැරීම යි

3).පරිභෝජනය යි 4).ආයෝජනය යි

14).සංවර්ධනය කරා යන ගමනේදී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම,

1).ආර්ථික සංවර්ධනයයි.
2).ධරණීය සංවර්ධනය යි.
3).සමාජ සංවර්ධනයයි .
4).පුද්ගල සංවර්ධනය යි.

**අංක 15, 16 ප්‍රශ්න සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.**

A.ආර්ථිකය විවිධාංගීකරණය වීම.
B.බුද්ධි ගලනය වේගවත් වීම.
C.විදේශ ණය හා ආධාර මත යැපීමට සිදුවීම.
D.නවීන තාක්ෂණය ගලා ඒම.

15).ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් දැක්වෙන වරණය තෝරන්න.

1).A හා B 2).A හා C 3).A හා D 4).C හා D

16).ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ඍණාත්මක බලපෑම් ඇතුළත් වරණය තෝරන්න.

1).B හා D 2).C හා D 3).A හා B 4).B හා C

17).යුතුකම් කොටස් දෙකකට බෙදේ.ඉන් එකක් නීතිමය යුතුකම් ලෙස සැලකේ.අනෙක් යුතුකම් කොටස වන්නේ,

1).ආගමික යුතුකම් ය 2).සමාජීය යුතුකම් ය
3).සදාචාරාත්මක යුතුකම් ය 4).පුරවැසි යුතුකම් ය.

18).ගැටුම් අවම කර ගැනීම සඳහා පුරවැසියෙකු තුළ වර්ධනය කරගත යුතු පුද්ගල ගුණාංගය වන්නේ,

1).යුතුකම් ඉටු කිරීමයි.
2).සහානුභූතිය යි.
3).ඵලදායි සන්නිවේදනය යි.
4).අන්මත ගරු කිරීමයි.

19).ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1).දේපළ අයිතිය රජය සතු වීම.
2).පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන අංශ දෙකම දක්නට ලැබීම.
3).මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙය වීම.
4).තරඟකාරී වෙළඳපලක් පැවතීම.

20).රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය,

1).සිවිල් නීතිය යි
2).දේශීය නීතිය යි
3).ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යි.
4).රෝම ලන්දේසි නීතිය යි.

21).පහත "අ" තීරුවේ සඳහන් අධිකරණ ආයතන සමඟ "ආ" තීරුවේ ඇති නඩු කටයුතු නිවැරදිව ගලපන ලද පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1.දිසා අධිකරණය | A.පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය. |
| 2.මහාධිකරණය | B.ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය. |
| 3.අභියාචනාධිකරණය | C.විවාහ සම්බන්ධ නඩු |
| 4.ශ්‍රේෂ්ඨාධිකරණය | D.නාවික අධිකරණ බලය. |

1).ACBD 2).CDAB 3).BACD 4).BCAD

22).ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,

1).අධිකරණ ඇමති ය

2).නීතිපතිතුමා ය

3).අග්‍ර විනිශ්චයකාරවරයා ය

4).ජනාධිපතිවරයා ය

23).නීතියේ ආධිපත්‍යය යනු,

1).මානව හිමිකම් පිළිබඳ මහජනයා දැනුවත් කිරීමයි.

2).අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමයි.

3).ව්‍යවස්ථාදායකය මඟින් පාලන කටයුතු සිදු කිරීමයි.

4).රටක පාලනය නීතියේ උත්තරීතර භාවයට අනුව සිදු කිරීමයි.

24).බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතරින් ලාංකිකයන්ට වැඩි දේශපාලන අවස්ථා හිමි වූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන්ද?

1).ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

2).කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

3).සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

4).මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

25).උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1).අනුරාධපුරය,පුත්තලම

2).යාපනය,මුලතිව්

3).අනුරාධපුරය,පොලොන්නරුව

4).යාපනය,මන්නාරම

26).1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(1) ව්‍යවස්ථාවට අනුව ඇතිකළ ප්‍රධාන වෙනස්කමක් වන්නේ,

1).විධායක ජනාධිපති තනතුර හඳුන්වා දීමයි.

2).අග්‍රාණ්ඩුකාර තනතුර ඇති කිරීමයි.

3).අග්‍රාමාත්‍ය තනතුර හඳුන්වා හඳුන්වා දීමයි.

4).නාමික විධායක ජනාධිපති තනතුර ඇති කිරීමයි.

27).නිෂ්පාදන සාධක නිවැරදිව සඳහන් කර ඇති වරනය තෝරන්න.

1).වැටුප,භූමිය,ශ්‍රමය,ප්‍රාග්ධනය

2).ව්‍යවසායකත්වය,භූමිය,පොලිය,ප්‍රාග්ධනය

3).භූමිය,ශ්‍රමය,ප්‍රාග්ධනය,ව්‍යවසායකත්වය

4).භූමිය,ලාභය,ප්‍රාග්ධනය,ශ්‍රමය

28).පාරිභෝගික භාණ්ඩයක් හා අන්තර් භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

1).දැව,පොහොර

2).ඇඳුම් පැළඳුම්,පොහොර

3).යන්ත්‍ර සූත්‍ර,වාහන

4).පොහොර,යන්ත්‍ර සූත්‍ර

29).ප්‍රාග්ධන සූක්ෂම ශිල්පීය ක්‍රම භාවිතය යනුවෙන් අදහස් කරනුයේ,

1).භාණ්ඩ නිෂ්පාදනයේ දී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.

2).භාණ්ඩ බෙදාහැරීමේ දී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.

3).භාණ්ඩ නිෂ්පාදනයේ දී යාන්ත්‍රික ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.

4).භාණ්ඩ බෙදා හැරීමේදී යාන්ත්‍රික ශ්‍රමය යොදා ගැනීමයි.

**අංක 30 හා 31 ප්‍රශ්න වලට පහත සඳහන් තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

A.රාජ්‍ය මූල්‍ය පාලනය.

B.අයවැය පාලනය

C.රාජ්‍ය සේවය පාලනය

D.නීති පැනවීම

E.විධායකය පාලනය

30).විධායකයේ කාර්යයන් දැක්වෙන වරණය තෝරන්න.

1).A හා B ය    2).A හා C ය    3).Aහා D ය    4).Aහා E ය

31).ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් පමණක් දැක්වෙන පිළිතුර වනුයේ,

1).A B හා D    2).A B හා C

3).B C හා D    4).B D හා E

32).වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග ගණන,

1).දෙකකි    2).තුනකි    3).හතරකි    4).පහකි

33).ප්‍රාදේශීය සභා පිහිටුවීම සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.

1).1939 අංක 61 ආඥා පනත යටතේ පිහිටුවා ඇත.

2).1987 අංක 15 දරන ආඥා පනත මඟින් පිහිටුවා ඇත.

3).1947 අංක 16 දරන ආඥා පනත මඟින් පිහිටුවා ඇත.

4).1947 අංක 15 දරන ආඥා පනත මඟින් පිහිටුවා ඇත.

34).ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මූලධර්ම හතරක් පදනම් කරගෙන සකස් කර ඇත.ඒවා නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1).ළමයාගේ උපරිම යහපත,සහභාගිත්වය,වෙනස්කොට සැලකීම,පැවැත්ම.

2).පැවැත්ම,සහභාගිත්වය,යුතුකම් ඉටු කිරීම,,සංවර්ධනය.

3).ළමයාගේ උපරිම යහපත ,සහභාගිත්වය,පැවැත්ම සහ සංවර්ධනය,වෙනස්කොට නොසැලකීම.

4).වෙනස්කොට සැලකීම,පැවැත්ම,ආරක්ෂාව,සංවර්ධනය.

35).රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

1).භූමිය,ජනගහනය,ආණ්ඩුව,ස්වාධිපත්‍යය.

2).භූමිය,ජනගහනය,පළාත් සභාව,ආණ්ඩුව.

3).භූමිය,ජනගහනය,අධිකරණය,ස්වාධිපත්‍යය.

4).භූමිය,ජනගහනය,පරමාධිපත්‍යය,ස්වාධිපත්‍යය.

36).ආණ්ඩුවේ විවිධ ස්ථරවල කාර්යභාරය,

1).ආදර්ශවත් පුරවැසියන් බිහිකිරීමයි.

2).ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීමයි.

3).ගැටුම් වැළැක්වීමට දායක වීමයි.

4).මහජන කටයුතු පහසු කරවීමයි.

37).ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වූයේ,

1).1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.

2).1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.

3).1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි .

4).1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.

38).වගකීම යනු,

1).වගකීම ඉටු කිරීමට ඇති බැඳීමයි.

2).පුරවැසියෙකු සතු නීතිමය බලයකි.

3).තමාට පැවරෙන කාර්ය හොඳින් ඉටු කිරීමයි.

4).ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය වීමයි.

39)."අප පෘථිවියේ කොටසක් වන අතර එය අපේ ම කොටසකි.සුවඳැති මල් අපේ සහෝදරයෝ වෙති".
මෙම නිර්වචනය දක්වා ඇති ප්‍රකාශනය වන්නේ,

1).සියැටල් ප්‍රකාශනය

2).පරිසර ශබ්දකෝෂය

3).පාරිසරික විද්‍යා ශබ්දකෝෂය

4).මිනිසා හා පරිසරය ග්‍රන්ථය.

40).පහත සඳහන් වන්නේ වායු දූෂණය සිදු වන ක්‍රම කිහිපයකි.

A.ගිනිකඳු පිපිරීම D.ගුවන් යානා භාවිතය
B.ලැව්ගිනි E.ප්‍රවාහන කටයුතු
C.දූවිලි කුණාටු

ඉහත සඳහන් ක්‍රම අතරින් ස්වභාවික ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

1).ABD 2).ABC 3).ACE 4).ABD

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 11 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය II | පැය - 02 යි. |

නම ..............................................................................

### II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්නය හතරක් ඇතුළුව ප්‍රශ්නය 5කට පිළිතුරු සපයන්න.

01).

I).ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් පවතින රටවල් දෙකක් නම් කරන්න.

II).නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

III).නීතිය පිළිබඳ නිර්වචන සැපයූ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

IV).අපරාධ නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වැරදි දෙකක් නම්කරන්න.

V).බේරුම්කරණය සිදුවන ආකාරය අනුව වර්ග කළ හැකි කොටස් දෙක නම් කරන්න.

VI).ශ්‍රී ලංකාවේ ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.

VII).ඕනෑම සේවකයෙකුට ම තෘප්තිමත්ව තම සේවා ඉටුකර දීම සඳහා හිමිවිය යුතු අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.

VIII).ගැටුම් වර්ග පුළුල් ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ අධ්‍යයනය කළ හැකිය.එම ක්ෂේත්‍ර දෙක නම් කරන්න.

IX).සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න.

X).පුරවැසියකු වශයෙන් ඉටු කළ යුතු මූලික යුතුකම් දෙකක් නම් කරන්න. **(2 × 20 = 40)**

02).ලෝකයේ බොහෝ රටවල් විවිධ ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ක්‍රියාවට නංවා ඇත.

I).ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II).රාජ්‍යය හා ආණ්ඩුව යනු ආයතන දෙකකි.ආණ්ඩුවක තිබිය යුතු ප්‍රධාන අංග තුන නම් කරන්න. (ලකුණු 3)

III).ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් ජනමාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

03).වර්තමාන ලෝකයේ බොහෝ රටවල් බහු සංස්කෘතික සමාජ ලෙස හැඳින්විය හැකිය.

I).බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)

II).බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට බලපාන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 3)

III).බහු සංස්කෘතික සමාජයක ජාතීන් අතර සහයෝගයන් ඇති කිරීමට පුරවැසියන් ලෙස අපට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

04).රටක නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වේ නම් එම සමාජය ද නීතිගරුක වේ.
I).නීතියේ ගුණාංග දෙකක් නම් කරන්න. (ලකුණු 2)
II).ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ ආයතනවලට අමතරව විශේෂ කාර්යයන් පදනම් කරගෙන පිහිටුවා ඇති අධිකරණ ආයතන තුනක් නම් කරන්න. (ලකුණු 3)
III).ශ්‍රී ලංකාවේ පොදු නීතියට අමතරව ක්‍රියාත්මක වන විශේෂ නීති තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5)

05).කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම සඳහා පළාත් පාලන ආයතන කටයුතු කරයි.
I).ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු2)
II).පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)
III).A.ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්ය වර්ගකර ඇති ප්‍රධාන තේමා තුන නම් කරන්න.
B.ඉන් එකක් යටතේ සිදුකරන කාර්යයන් කෙටියෙන් ලියන්න. (ලකුණු 5)

06).අයිතිවාසිකම් යන්න ඉතා පුළුල් සංකල්පයකි.
I).මිනිසුන් තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා විවිධ අරගලවල නිරත වූ බව ඉතිහාසයේ සඳහන් වේ.එසේ අයිතිවාසිකම් දිනාගැනීමට කටයුතු කළ අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)
II).සීඩෝ සම්මුතියට අනුව කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් කොටස් කිහිපයක් යටතේ පෙළගස්වා ඇත. ඉන් තුනක් නම් කරන්න. (ලකුණු 3)
III). A.ළමා අයිතිවාසිකම් උල්ලංඝනය විය හැකි අවස්ථා දෙකක් නම් කරන්න.
B.ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් සහතික කර ඇති අයිතිවාසිකම් තුනක් නම් කරන්න. (ලකුණු 5)

07).මිනිසාගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ගනු ලබන සංවර්ධන ප්‍රයත්න පරිසර දූෂණය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.
I).පාරිසරික ගැටලු පැන නැඟීමට හේතුවන,
A.මිනිස් ක්‍රියාකාරකමක්
B.ස්වභාවික සංසිද්ධියක් පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 2)
II).පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන/දෙපාර්තමේන්තු තුනක් නම් කරන්න. (ලකුණු 3)
III).පරිසරය සම්බන්ධයෙන් මිනිසාගෙන් ඉටුවිය යුතු යුතුකම් තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

**මතුගම අධ්‍යාපන කලාපය.**
**දෙවන වාර පරීක්ෂණය.**
**පුරවැසි අධ්‍යාපනය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය.**
**I කොටස**

| | | | |
|---|---|---|---|
| 1).3 | 11).1 | 21).2 | 31).4 |
| 2).3 | 12).3 | 22).2 | 32).2 |
| 3).3 | 13).3 | 23).4 | 33).2 |
| 4).3 | 14).2 | 24).1 | 34).3 |
| 5).2 | 15).3 | 25).3 | 35).1 |
| 6).4 | 16).4 | 26).1 | 36).4 |
| 7).2 | 17).3 | 27).3 | 37).3 |
| 8).3 | 18).3 | 28).2 | 38).3 |
| 9).2 | 19).4 | 29).3 | 39).1 |
| 10).3 | 20).3 | 30).2 | 40).2 |

**II පත්‍රය.**

01)

I.

II.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,විවිධ අණපනත්,අධිකරණ තීන්දු,සිරිත් විරිත්.

III).T.H.ග්‍රීන් ජොන් ඔසටින්.

IV).මිනීමැරුම්,ස්ත්‍රී දූෂණ,මිනීමැරීමට තැත් කිරීම,රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ.

V).ස්වෙච්ඡාවෙන් ඇතිකරන බේරුම්කරණය.
අනිවාර්යෙන් බේරුම්කරණය.

VI).අනුරාධපුරය,පොළොන්නරුව

VII).ජීවත්වීමට සරිලන වැටුප
නිවාඩු
සේවා සුරක්ෂිතතාව/සමාජ ආරක්ෂාව /සෞඛ්‍ය පහසුකම්

VIII).

IX).ජීවත්වීමට ඇති අයිතිය.
ආගම ඇදහීමේ අයිතිය.
ඡන්දය භාවිත කිරීමේ අයිතිය.

X).ජාතික සමගිය ඇති කිරීම.
පොදු දේපළ ආරක්ෂා කිරීම/පොදු දේපළ සුරක්ෂිත කිරීම.
ස්වභාවික සම්පත් රැක ගැනීම/ස්වභාව ධර්මය ආරක්ෂා කිරීම.

02).
I).සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයින් තෝරා ගැනීම.
තරගකාරී පක්ෂ ක්‍රමය.
ඡන්ද කොට්ඨාස ක්‍රමය/නිදහස් හා සාධාරණ මැතිවරණ.

II).ව්‍යවස්ථාදායකය,විධායකය,අධිකරණය.
III).සත්‍යහා නිවැරදි තොරතුරු ජනතාවට සැපයීම.
පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කිරීම.
ජනතාවගේ දැනුම වර්ධනය.
කාලීන තොරතුරු නිසි වේලාවට ලබා දීම.

03).
I).විවිධ ජන වර්ග/විවිධ ආගමික විශ්වාස දරන/විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත්වීම.
ඒ ඒ සංස්කෘතින්ට ආවේණික ආවේණික සිරිත් විරිත් ආචාර ධර්ම.
ප්‍රාදේශීය විවිධත්වය.

II).පිහිටීම,සංක්‍රමණ,ආක්‍රමණ,විවිධ ජාතීන් වෙළදාම සඳහා පැමිණීම.

III).අන්‍ය සංස්කෘතින්ට ගරු කිරීම.
සාමූහිකත්වය වර්ධනය.
සමානාත්මතාවය/අන්‍ය මත ඉවසීම.අනෙක් ජන වර්ග වල භාෂා ඉගෙනීම.

04).
I).අධිකාරී බලය පදනම් කරගෙන රාජ්‍ය විසින්ම පැනවීම.
යුක්ති සහගත හා සාධාරණ වීම
වෙනස් වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් වීම.
නිරවුල් හා පැහැදිලි ව දැක් විය යුතු වීම.

II).කාති උසාවි
කම්කරු විනිශ්චය සභාව
ගෙවල් කුලී මණ්ඩලය.

III).උඩරට නීතිය,තේසවලාමේ නීතිය, මුස්ලිම් නීතිය.

05).
I).මහ නගර සභා ,නගර සභා ,ප්‍රාදේශීය සභා.

II).මහජන උපයෝගීතා සේවාවන් පහසුවෙන් ලබාගත හැකි වීම.
ප්‍රාදේශීය /ජාතික නායකයින් බිහි බිහිවීමට පසුබිම සැකසීම.
ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඉටු කරගැනීම/ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වේගවත් කිරීම.

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සංවිධානාත්මකව පවත්වාගෙන යාම.
III).A.පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා.
B.(අදාල තොරතුරු සඳහා ලකුණු ලබා දෙන්න)

06).
I).බ්‍රිතාන්‍යයේ මැග්නාකාර්ට ගිවිසුම .
බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත.
ඇමරිකානු නිදහස් ප්‍රකාශනය/රුසියානු විප්ලවය.

II).කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්.
පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්.
අධ්‍යාපනයට හා පුහුණු වීමට ඇති අයිතිවාසිකම්.

III).A.පැහැරගෙන යෑම, පාසල් නොයැවීම, වදහිංසාවලට ලක් කිරීම, සේවයට යොදා ගැනීම.
B.ප්‍රකාශනයේ නිදහස, චින්තනයේ නිදහස ,සමාගමේ නිදහස, ක්‍රියා කිරීමට ඇති අයිතිය.

07)
I).A.
B.

II).පරිසර අමාත්‍යාංශය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

III).ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම, වනාන්තර හා වන සතුන් ආරක්ෂා කිරීම, අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීම.